# රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
## ජනමාධ්‍ය පර්යේෂණ අංශය

ලිපිනය : 163, කිරුළපන මාවත, කොළඹ 05 | දුරකථන : +94 112 512 749 | විද්‍යුත් තැපැල් : govinformediaresearch@gmail.com


ප්‍රධාන කර්තෘ/ ප්‍රවෘත්ති කර්තෘ

අධ්‍යක්ෂ(ප්‍රවෘත්ති)/ ප්‍රවෘත්ති කළමනාකරු

# ප්‍රවෘත්ති නිවේදනය

**ත්‍රිවිධ හමුදා නිලධාරීන් ගේ චිත්ත ධෛර්යය හා මානසික සංවර්ධනය වෙනුවෙන්
විශ්ව සම්භාව්‍ය සිනමා දැක්ම**

**" Maghna Gulzar" අධ්‍යක්ෂණය කළ " Sam Bahadur" චිත්‍රපටය
2024.07.25 දින පස්වරු 1.30 ට රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ශ්‍රවණාගාරයේ දී...**

රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව දියුණු සංස්කෘතික මිනිසකු බිහි කිරීම සහ ත්‍රිවිධ හමුදා නිලධාරීන්ගේ දැනුම, අධ්‍යාපනය සහ රසවින්දනය දියුණු කිරීමේ අරමුණින් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ත්‍රිවිධ හමුදා මාධ්‍ය අංශ සමග ඒකාබද්ධව මසකට වරක් සංවිධානය කරනු ලබන විශ්ව සම්භාව්‍ය සිනමා දැක්ම සහ සිනමා කතිකාව වැඩසටහන යටතේ 2024.07.25 දින ප.ව.1.30 ට රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ විශේෂ චිත්‍රපට ප්‍රදර්ශනය පැවැත්වේ .

සිනමාව දාර්ශනික ප්‍රවේශයක් යටතේ විග්‍රහ කරමින් සිනමාව සතු සමාජ විද්‍යාත්මක භූමිකාව අර්ථ දක්වමින් ත්‍රිවිධ හමුදා නිලධාරීන්ගේ චිත්ත ශක්තිය හා මානසික සංවර්ධනය වෙනුවෙන් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ජනමාධ්‍ය පර්යේෂණ අංශය සංවිධානය කරනු ලබන විශ්ව සම්භාව්‍ය සිනමා දැක්ම හා කතිකාව වැඩසටහන (60) වෙනුවෙන් ඉන්දියානු සිනමා ඉතිහාසය තුළ සම්මාන ගණනාවක් සඳහා පාත්‍ර වූ **"Sam Bahadur"** චිත්‍රපටය 2024.07.25 දින ප.ව.1.30 ට ප්‍රදර්ශනය කෙරේ.

මෙවර විශ්ව සම්භාව්‍ය  සිනමා දැක්ම හා කාතිකාව වැඩසටහනේ ප්‍රධාන ආරාධිතයා ලෙස ආරක්ෂක ලේකම් විශ්‍රාමික (ජෙනරාල් ) කමල් ගුණරත්න මහතා සහ ත්‍රිවිධ හමුදාපතිවරුන්ගේ සහභාගීත්වයෙන් පැවැත්වෙන අතර සිනමා කථිකාවේ මුඛ්‍ය දේශනය  කොළඹ විශ්ව විද්‍යාලයේ ශ්‍රී පාලි මණ්ඩපයේ හිටපු මණ්ඩපාධිපති මහාචාර්ය ටියුඩර් වීරසිංහ මහතා  විසින් පවත්වනු ලැබේ .

ඉන්දීය හමුදාවේ පළමු ෆිල්ඩ් මාර්ශල්  ධූරය දැරූ **සෑම් හෝමුස්ජි මනිෂ්කාව්ගේ** ජීවිත කතාව මෙන්ම ඔහු තම ජීවිතය තුළ ඉන්දියාව හමුදාව වෙනුවෙන් කළ සේවය නිරූපණය කරන මෙම චිත්‍රපටය නැරඹීම සඳහා ත්‍රිවිධ හමුදාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 300 කට  ආසන්න පිරිසක් එක් වන බව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ජනමාධ්‍ය පර්යේෂණ අංශය පවසයි.

*ජනමාධ්‍ය පර්යේෂණ අංශය,*
*රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව.*
*2024/07/11*